# සටන් විරාම ගිවිසුමෙහි මළගම හා බටහිරයෝ

පසුගිය දා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා වැදගත් ප්‍රකාශයක් කෙළේ ය. ඒ මහතා කියා සිටියේ සටන් විරාම ගිවිසුම වැඩක් නොමැති ලියවිල්ලක් යන අදහස ගෙන දෙන්නක් ය. ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ඒ මහතාට අපි ස්තුතිතිවන්ත වෙමු. ඒ සමග ආණ්ඩුවෙන් ප්‍රකාශ වුයේ කොටි සමග සාකච්ඡා සඳහා කිසිදු පූර්ව කොන්දේසියකට එකඟ නොවන බව ය. ඒ ප්‍රකාශය සමග නම් අපේ එකඟත්වයක් නැත. කොටි සමග කිසිදු සාකච්ඡාවක් අනවශ්‍ය යැයි අපි කියා සිටිමු. කළ යුත්තේ කොටි සමූලඝාතනය කිරීම ය.

ඊනියා සටන් විරාම ගිවිසුම කිසිදාක නිත්‍යානුකූල ලියවිල්ලක් නො වී ය. අපේ ව්‍යවස්ථාවට අනුව සටන් විරාමයක් ප්‍රකාශ කළ හැක්කේ ජනාධිපතිවරයාට පමණකි. ඒ ද යුද්ධයක් පවතින අවස්ථාවක ය. මෙරට යුද්ධයක් නැත. 2002 ඊනියා සටන් විරාම ගදවිසුම අත්සන් කෙළේ රටේ එවකට ජනාධිපතිනිය වූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නොව එවකට අගමැති වූ රනිල් වික්‍රමසිංහ මහතා ය. අගමැති වුවත් ඒ මහතා ජනාධිපති නො වී ය. අගමැතිට ඊනියා සටන් විරාම ගිවිසුමකට අත්සන් කළ හැකි නමුත් ඒ වලංගු නිත්‍යානුකූල ලියවිල්ලක් බවට පත් නො වෙයි.

ඊනියා සටන් විරාම ගිවිසුමට එරෙහිව එය තහනම් කරන ලෙස ඉල්ලමින් ජනතා විමුක්ති පෙරමුණ හා ජාතික හෙළ උරුමය අධිකරණය හමුවට ගිය අවස්ථාවේ දුන් තීන්දුව අනුව ද කියැවුනේ ඒ ගිවිසුම නීත්‍යානුකූල නොවන බව ය. නීත්‍යානුකූල නොවන ගිවිසුමක් තහනම් නොකළ හැකි බව අධිකරණයෙන් පැවසිනි. යමක් තහනම් කිරීමට නම් ඒ (නීතිය ඉදිරියේ) පැවතිය යුතු ය. එසේ නොපවතින දෙයක් තහනම් කළ හැකි නො වෙයි. කෙසේ වෙතත් ඒ තීන්දුවට එරෙහිව ඒ පක්ෂ අභියාචනා ඉදිරිපත්කර ඇත.

ඒ ලියවිල්ල බටහිරයන්ගේ අවශ්‍යතා මත නෝර්වේ මැදිහත්වීමෙන් කෙටුම්පත් කරන ලද්දක් විය යුතු ය. ලියවිල්ලට අත්සන් තැබීමට සූදානම් ව සිටියේ ප්‍රභාකරන් හා රනිල් වික්‍රමසිංහ මහතා ය. රනිල් වික්‍රමසිංහ මහතා ඒ සඳහා නෝර්වේ තානාපති සමග උතුරට ගියේ ය. එහෙත් ප්‍රභාකරන් එයට අත්සන් තැබීමට නො පැමිණියේ ය. ඒ ගැන රනිල් වික්‍රමසිංහ මහතා තම අසතුට පෙන්වුයේ නෝර්වේ තානාපතිට අතට අත නො දීමෙනි. ඊනියා සටන් විරාම ගිවිසුමට ප්‍රභාකරන්ගේ අත්සන ගනු ලැබුයේ පසුව ය. ගිවිසුම අත්සන්කිරීම පිළිබඳ ව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය දැනසිටියේ යැයි කිව නො හැකි ය. දැන සිටියත් ඇය විරෝධය දක්වනු ඇතැයි සිතිය නො හැකි ය. එයට හේතුව රනිල් වික්‍රමසිංහ මහතා මෙන් ම චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද මූලික වශයෙන් සිංහල බෞද්ධ විරෝධී වීම ය. එහෙත් කුමාරතුංග මහත්මිය ශ්‍රී ල නි පක්ෂයේ එවකට සිටි නායිකාව වීම නිසා ම ඇයට ජාතිකත්වයට මුළුමනින් ම පිටු පෑ හැකි නො වෙයි.

ඒ ලියැවිල්ලෙන් බටහිරයන් බලාපොරොත්තු වූ කරුණු දෙකක් වූ බව අපි ඒ දිනවල ම කීවෙමු. ඉන් එක් කරුණක් වුයේ ලංකාණ්ඩුව හා කොටි ත්‍රස්තවාදී සංවිධානය සම තත්වයෙහි ලා සැලකීම ය. අනෙක ලංකාණ්ඩුවේ හමුදා හා කොටි සංවිධානයේ ත්‍රස්තවාදි පිරිස් එකම මට්ටමක ලා සැලකීම ය. වෙනත් වචනවලින් කිවහොත් රටේ ආණ්ඩු දෙකක් හා හමුදා දෙකක් ඇති බවත් ආණ්ඩුවේ මෙන් ම කොටින්ගේ ද පාලනය යටතේ පවතින ප්‍රදේශ පවතින බවත් ඒ ගිවිසුම මගින් පිළිගැනිණි. එවැනි ගිවිසුමක් නිත්‍යානුකූල නොවුවත් අත්සන්කිරීම තදබල වරදකි. වෙනත් රටක නම් ඒ සඳහා මැදිහත් වුවනට එරෙහිව රටට ද්‍රෝහීවීම පිළිබඳ ව නඩු පැවරීමට තිබුණි. එහෙත් මෙරට දේශපාලනඥයන් කරන වැරදිවලට දඬුවම් ලැබෙන්නේ කලාතුරකිනි.

ඒ ඊනියා ගිවිසුම අනුව කොටින්ගේ පාලනයෙහි පැවති ප්‍රදේශයට නැගෙනහිර පළාත ද අයිතිය. එහෙත් අද නැගෙනහිර පළාතේ කොටි පරාජය වී ඇත. එවැනි තත්වයක නැගෙනහිර පළාත කොටි පාලනය යටතේ පවතින ප්‍රදේශයක් යැයි කිවහැක්කේ කාහට ද? ඊනියා ගිවිසුම මගින් නැගෙනහිර පළාත ද කොටි පාලනය යටතේ පවතින ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන තිබුණි. අද ඊනියා ගිවිසුම සෑම අතින් ම බංකොලොත් ලියැවිල්ලක් බවට පත් වී ඇත. ඉන් අදහස් කරන්නේ කලින් එයට වටිනාකමක් තිබූ බව නො වෙයි. මුළු ගිවිසුමේ ම වලංගු භාවයක් නැත. එමෙන් ම කොටි පාලනය යටතේ පැවති ප්‍රදේශ යනුවෙන් ප්‍රදේශ හඳුනාගැනීම ම වැරදි ය. එහෙත් අවශ්‍ය නම් නැගෙනහිර

© Prof. Nalin De Silva

පළාතේ කොටි කඳවුරු පවත්වාගෙන ගිය ප්‍රදේශ යනුවෙන් ප්‍රදේශ කිහිපයක් හඳුනාගැනීමේ හැකියාව එකල තිබුණි. අද නැගෙනහිර පළාතේ එවැනි තත්වයක්වත් නැත.

එහෙත් උතුරු පළාතේ ඇතැම් ප්‍රදේශවල කොටි කඳවුරු ඇති බව අප පිළිගත යුතු ය. කොටි කඳවුරු ඇතැයි යන්නෙන් ඒ ප්‍රදේශ කොටි පාලනය යටතේ ඇති ප්‍රදේශ යැයි නම්කළ හැක්කේ නොර්වේ ඇතුළු බටහිරයන්ට, ඔවුන්ගේ හෙංචයියලා වූ ඇතැම් මාක්ස්වාදී පක්ෂවලට (බටහිරයන් විසින් මූල්‍යාධාර දී පවත්වාගෙන යනු ලබන මාක්ස්වාදී පක්ෂ ද මෙරට වෙයි) හා ඔවුන්ගේ අනුගාමිකයන්ට, මැට්ටන් හා පුස්සන් වූ හේතුවාදීන්ට, භෞතිකවාදීන්ට හා වෙනත් එවැන්නන්ට ය. මේ පිරිසට කැබිනට් මණ්ඩලයේ ඇතැම් ඇමතිවරු ද අයත් වෙති. තිස්ස විතාරණ මහතා ඉන් එක් තැනැත්තෙකි. ඔහුට අනුව දැනටමත් මෙරට දෙකඩ වී ඇත. ඒ කොටි කඳවුරු කිහිපයක් තවමත් උතුරු පළාතේ පවතින බැවිනි. මේ කවටයන්ට අනුව කළයුත්තේ සන්ධීය (ෆෙඩරල්) රාජ්‍යයක් පිහිටුවා රට එක්සත් කිරීම ය. ඔවුන් කවටයන් බව සැබෑ නමුත් ඔවුන්ගේ කවටකම කෙළවර වන්නේ රටට ද්‍රෝහිවීමෙනි. මෙවැන්නන් හා රනිල් වික්‍රමසිංහ මහතා අතර මූලික වශයෙන් වෙනස්කමක් නැත. අවසාන විග්‍රහයෙහි දී ඔවුහු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සුවච සේවකයෝ වෙති. කාල් මාක්ස් ද එවැනි සේවකයෙක් පමණක් විය.

ඊනියා සටන් විරාම ගිවිසුම පිළිබඳ ව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් පදවිය දරන්නා කලින් සඳහන් කළ ඉතා වැදගත් ප්‍රකාශය කර තිබිය දී ජ වි පෙ තවදුරටත් ආණ්ඩුවෙන් ඉවත් වී සිටීම එහි සන්ධීයවාදීන් ශක්තිමත් කිරීමක් පමණකි. ජ වි පෙ කළයුත්තේ ආණ්ඩුවට එකතු වී බටහිරයන් හා ඔවුන්ගේ ගැත්තන් හා ඉත්තන් පරාජයකිරීමට කටයුතු කිරීම ය. අද ජ වි පෙරමුණට සටන්පාඨ නැතිවන තත්වයක් උද්ගත වී ඇත. ප්‍රේමදාස මහතා ජනාධිපති ව සිටිය දී ද ජ වි පෙරමුණට එවැනි තත්වයකට මුහුණ දීමට සිදුවිය. සාම සාධක හමුදා ලෙස මෙරටට පැමිණි ඉන්දීය හමුදා ආපසු යවන ලෙස ජ වි පෙ එදා උද්ඝෝෂණය කෙළේ ය. වැඩිකල් නොගොස් ප්‍රේමදාස මහතා පන්සලක පැවති උත්සවයක දී ඉන්දීය හමුදා ආපසු යවන බව ප්‍රකාශ කර ටික දවසකින් ඒ හමුදා යැවී ය. ජ වි පෙරමුණට ඉන්පසු සටන්පාඨ අර්බුදයක් විය.

අද ද ජ වි පෙරමුණට සටන්පාඨ හිඟයක් ඇති බව පෙනී යයි. ඊනියා සටන් විරාම ගිවිසුම අහෝසිකිරීමට ඉල්ලීම වරදකි. (වලංගු) නැති ගිවිසුමක් (නීතියෙන්) නැතිකරන්නේ කෙසේ ද? කළ හැක්කේ නැති ගිවිසුම නැති බව පිළිගැනීම ය. එනම් නැති ගිවිසුම නැති ගිවිසුමක් ලෙස සැලකීම ය. ආණ්ඩුව කර ඇත්තේ එය ය. නැති ගිවිසුමක් නැතිකිරීමට උත්සාහ ගැනීම නැති මම (මනස) නැතිකිරීමට උත්සාහ ගැනීම වැන්නකි. එහි දී සිදුවන්නේ මම තව තවත් දැඩි වීම ය. එවැන්නකුට නිවන් අවබෝධය දුර ය.

දැන් කළ යුත්තේ උතුරු පළාතේ කොටි කඳවුරු ද විනාශකර කොටි සමූලඝාතනය කිරීම ය. එහෙත් බටහිරයන් හා ඉන්දියාව ඒ කිරීමට ඉඩ දේ යැයි සිතිය නො හැකි ය. ඔවුන්ට කොටි විනාශකිරීමට පළමුව ඊනියා දේශපාලන විසඳුමක් අවශ්‍ය වෙයි. එනම් සන්ධීය රාජ්‍යයක් දෙමළ ජාතිවාදයට ලබාදීම ඔවුන්ගේ අරමුණ වෙයි. එලෙස සන්ධීය රාජ්‍යයක් ලබා නො දී කොටි සමූලඝාතනය කිරීමට ආණ්ඩුව සූදානම් වුවහොත් බටහිරයන් මෙරටට එක්සත් ජාතීන්ගේ ඊනියා සාම සාධක හමුදා එවීමට පියවර ගනු ඇත. ඒ අතර ආර්ථික තහංචි පැනවීමෙන් ද ලංකාණ්ඩුව සිරකිරීමට ඔවුන් උත්සාහ දරණු ඇත.

ක්ෂමා සංවිධානය ක්‍රිකට් ලෝක කුසලානෙහි දී නැටූ නාඩගම මෙන් ම රනිල් වික්‍රමසිංහ මහතා අද ඊනියා මානව අයිතිවාසිකම් සංවිධාන අටවාගෙන නටන නාඩගම ද බටහිරයන්ට එක්සත් ජාතීන්ගේ හමුදා එවීමට හා ආර්ථික තහංචි පැනවීමට පසුබිම සකසන ව්‍යාපාර පමණකි. රනිල් වික්‍රමසිංහ මහතා බටහිරයන්ගේ මෙරට සිටින හොඳම නියෝජිතයා වෙයි. සංස්කෘතික වශයෙන් ඔහු ඇංග්ලිකන් ක්‍රිස්තියානි වෙයි. ඔහුගේ පියා ආගමින් ද ඇංග්ලිකන් ක්‍රිස්තියානි විය. බටහිරයන්ගේ මනස කියවීමට ඇති එක් ආකාරයක් වනුයේ රනිල් වික්‍රමසිංහ මහතාගේ දේශපාලන හැසිරීම අධ්‍යයනය කිරීම ය. ඔහුගේ ප්‍රෝඩාකාරී මානව අයිතිවාසිකම් ව්‍යාපාරය පරාජය කළයුතු ය. ඒ ඔස්සේ බටහිරයන්ගේ සැලසුම් පරාජය කළයුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva